# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 47 දරන
# පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1990 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 47 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 19 වන දින]

එල්.ඩී—ඕ. 38/89

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1990 අංක 47 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ දීර්ඝ නාමයේ "එක්තරා නියත කාලයක් ව්‍යවස්ථාදායකයේ සේවය කළ මන්ත්‍රීවරයන් සහ ඔවුන්ගේ වැන්දඹුවන් උදෙසා විශ්‍රාම වැටුප් ක්‍රමයක්" යන වචන වෙනුවට "එක්තරා නියත කාලයක් ව්‍යවස්ථාදායකයේ සේවය කළ මන්ත්‍රීවරයන් සහ ඔවුන්ගේ වැන්දඹුවන් හා දරුවන් උදෙසා විශ්‍රාම වැටුප් ක්‍රමයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයන්ව සිටීම අවසන් වී ඇති තැනැත්තන්ට සහ ඒ තැනැත්තන්ගේ වැන්දඹුවන්ට" යන වචන වෙනුවට "ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයන්ව සිටීම අවසන්වී ඇති තැනැත්තන්ට සහ ඒ තැනැත්තන්ගේ වැන්දඹුවන්ට හා දරුවන්ට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ "මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී" යන වචනවල සිට "විශ්‍රාම වැටුපකට හිමිකම ලබන්නේය" යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටින්නා වූ යම් තැනැත්තකු සහ ඒ තැනැත්තාගේ වැන්දඹුව හා දරුවන්, මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නාහ." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**"ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් තමා සේවය කළ කාලය තුළදී, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ධුර එකක් හෝ වැඩි සංඛ්‍යාවක්, මුළුමනින් අවුරුදු පහක් වූ අවම කාලයක් දරා ඇති යම් තැනැත්තෙක්—

(අ) ඔහු ඒ ධුර එකක් පමණක් දරා ඇත්නම් හෝ ධුර දරන්නන්ට ගෙවනු ලබන වැටුප් සමාන වන්නා වූ ඒ ධුර එකකට වැඩි සංඛ්‍යාවක් දරා ඇත්නම්, ඒ ධුරය දරන්නාට දැනට ගෙවනු ලබන මූලික වැටුපෙන් තුනෙන් පංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් මාසිකව ගෙවනු ලැබීමට ; හෝ

2—ඩී 009728—5,715 (90/06)

(ආ) ඔහු ඒ ධුර එකකට වැඩි සංඛ්‍යාවක් දරා ඇත්නම් හා ඒ එක් ධුරයක් දරන්නාට ගෙවනු ලබන වැටුප, ඒ වෙනත් ධුරයක් හෝ ධුර දරන්නාට හෝ දරන්නන්ට ගෙවනු ලබන වැටුපට වැඩි නම්, ඒ ධුර අතුරින් වැඩිම වැටුප ලබන ධුරය දරන්නාට දැනට ගෙවනු ලබන මූලික වැටුපෙන් තුනෙන් පංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් මාසිකව ගෙවනු ලැබීමට ; සහ

ඔහු මුළුමනින් අවුරුදු පහළොවක කාලයක් හෝ ඊට වැඩි කාලයක් ඒ ධුර එකක් හෝ වැඩි සංඛ්‍යාවක් දරා ඇත්නම්, ඒ මූලික වැටුපෙන් උපරිම වශයෙන් තුනෙන් දෙපංගුවක් වන්නාවූ විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේ ය:

එසේ වුව ද ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් තමා සේවය කළ කාලය තුළ දී, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති යම් එක් ධුරයක් හෝ වැඩි සංඛ්‍යාවක්, මුළුමනින් අවුරුදු පහකට වැඩි එහෙත් අවුරුදු පහළොවකට අඩු වන්නා වූ කාලයක් දරා ඇති යම් තැනැත්තෙක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කථානායකවරයා විසින් පිළියෙළ කරනු ලබන ගෙවීම් චක්‍රයකට අනුකූලව නිශ්චය කරනු ලබන ප්‍රමාණානුකූල මාසික විශ්‍රාම වැටුපක් ලැබිය යුතු වන්නේ ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "මේ පනත යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් ලබන්නා වූ ද ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුව වීමේ හේතුවෙන් ඒ විශ්‍රාම වැටුප ලබන තැනැත්තකු නොවන්නා වූ ද" යන වචන වෙනුවට, "මේ පනත යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් ලබන්නා වූ ද ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුව හෝ දරුවකුවීමේ හේතුවෙන් ඒ විශ්‍රාම වැටුප ලබන තැනැත්තකු නොවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*"ව්‍යවස්ථා දායකයේ මන්ත්‍රීවරයන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප ගෙවීම.*

7අ. (1) මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු මියගිය විට, ඒ මන්ත්‍රීවරයාගේ වැන්දඹුව හෝ ඒ මන්ත්‍රීවරයාගේ කලත්‍රයා ඔහුට කලින් මියගොස් ඇති අවස්ථාවක, ඒ මන්ත්‍රීවරයාගේ දරුවන් හෝ ඒ විශ්‍රාම වැටුප ලැබිය යුතු ය. ඒ විශ්‍රාම වැටුප ඒ මන්ත්‍රීවරයා මිය යන අවස්ථාව වන විට විශ්‍රාම වැටුප වශයෙන් ඒ මන්ත්‍රීවරයාට ගෙවිය යුතුව තිබුණු මුදලට සමාන මුදලක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ දරුවන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප—

(අ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන එක් දරුවකු පමණක් එම මන්ත්‍රීවරයාට සිටී නම්, ඒ විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන්ම ඒ දරුවාට ගෙවනු ලැබිය යුතු ය.

(ආ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන එක් දරුවකුට වැඩි ගණනක් එම මන්ත්‍රීවරයාට සිටී නම්, ඒ විශ්‍රාම වැටුප ඒ දරුවන් අතර සමාන කොටස් වලට බෙදා ගෙවිය යුතු ය.

(3) එකතුව අවුරුදු පහකට අඩු කාල සීමාවක් ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කර ඇත්තාවූ ද, තමා වෙත සපයා ඇති කරුණු මත නීතිපතිවරයා විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වරදක් සමන්විත කරන ක්‍රියාවකින් මරණය සිදුකර ඇති බවට නීතිපතිවරයා විසින් සහතික කරන ලද්දාවූ ද, යම් තැනැත්තකු (1) වන උප වගන්තියේ කාර්යය සඳහා අවුරුදු පහක අවම කාල සීමාවක් ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කරනු ලැබූ ලෙස ද ඔහුගේ මරණය සිදුවූ අවස්ථාවේ දී මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති ලෙස ද සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ—

(අ) ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුවට හෝ කලත්‍රයාට ගෙවිය යුතු විශ්‍රාම වැටුප ගෙවීම, ඒ වැන්දඹුව හෝ කලත්‍රයා මිය යෑම හෝ නැවත විවාහවීම යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව මත අවසන් විය යුතු ය ; තව ද.

(ආ) ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ දරුවකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප ගෙවීම, ඒ දරුවා වයස අවුරුදු විසි එකට එළඹීම හෝ ඔහු විවාහවීම යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව මත අවසන් විය යුතු ය.

(5) මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබූ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුව හෝ කලත්‍රයා මියයෑමේ දී හෝ නැවත විවාහවීමේ දී හෝ ඒ වැන්දඹුව හෝ කලත්‍රයා මියගිය

2—ඩී 009728 (90/06)

හෝ නැවත විවාහවූ හෝ අවස්ථාවේ දී මේ පනත යටතේ ඒ වැන්දඹුවට හෝ කලත්‍රයාට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණයට සමාන විශ්‍රාම වැටුප් ප්‍රමාණයක් එම මන්ත්‍රීවරයාගේ දරුවන්ට ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ දරුවන්ට මේ උපවගන්තිය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප—

(අ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන එක් දරුවකු පමණක් එම මන්ත්‍රීවරයාට සිටි නම් ඒ විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන්ම ඒ දරුවාට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන එක් දරුවකුට වැඩි ගණනක් එම මන්ත්‍රීවරයාට සිටි නම්, ඒ විශ්‍රාම වැටුප ඒ දරුවන් අතර සමාන කොටස් වලට බෙදා ගෙවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මන්ත්‍රීවරයකුගේ දරුවකුට (5) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප ගෙවීම, ඒ දරුවා වයස අවුරුදු විසි එකට එළඹීම හෝ ඔහු විවාහවීම යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව මත අවසන් විය යුතු ය.

(7) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, (1) වන උපවගන්තිය හෝ (5) වන උපවගන්තිය හෝ යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇති දරුවකු තමාගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්‍යතාවකින් පෙළෙන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධරයන් තුන් දෙනකුගෙන් සමන්විත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඒ දරුවාට ඔහුගේ ජීවිත කාලය තුළ දී (1) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ හෝ සඳහන් ප්‍රකාරයට ගණන් බලනු ලැබූ ඒ විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් තිබිය යුතු ය.

(8) ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු විසින් නීත්‍යනුකූලව දරුකමට හදා ගන්නා ලද දරුවකු, මේ පනතේ සියලු කාර්ය සඳහා, ඒ මන්ත්‍රීවරයාගේ දරුවකු ලෙස සලකනු ලැබිය යුතු බවට සැක දුරු කිරීම සඳහා, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයා" යන අර්ථ කථනයේ (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉ) 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුවට, එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මන්ත්‍රීවරයකු ඇතුළුව, මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගනු ලැබූ ; සහ".

9. (1) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලබමින් සිටි ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුව මේ පනත ආරම්භ වන දිනයේ දී මියගොස් ඇති අවස්ථාවක හෝ නැවත විවාහ වී ඇති අවස්ථාවක, ඒ වැන්දඹුව මියගිය හෝ නැවත විවාහ වූ හෝ අවස්ථාවේදී ඇයට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණයට සමාන විශ්‍රාම වැටුප් ප්‍රමාණයක් එම දිනයේ සිට බලපාන පරිදි, එම මන්ත්‍රීවරයාගේ යම් දරුවකුට ලැබීමට හිමිකම් තිබිය යුතුය. ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ දරුවන්ට මේ වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල— මේ පනත ආරම්භ වන දිනයේ දී වැන්දඹුව මියගොස් හෝ නැවත විවාහ වී ඇති අවස්ථාවක දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.

(අ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් සහ එක් දරුවකු පමණක් එම මන්ත්‍රීවරයාට සිටීනම්, ඒ විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන්ම ඒ දරුවාට ගෙවිය යුතු ය ;

(ආ) ඒ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන එක් දරුවකට වැඩි ගණනක් එම මන්ත්‍රීවරයාට සිටීනම්, ඒ විශ්‍රාම වැටුප ඒ දරුවන් අතර සමාන කොටස්වලට බෙදා ගෙවිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තියේ (5), (6) සහ (7) වන උප වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපකට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ජීවත්ව සිටියේ නම් ඒ ප්‍රඥප්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් තිබුණා වූ ද, එසේම 1982 ජනවාරි මස 1 වන දින ස්වකීය වැන්දඹුව ජීවත්ව සිටියේ නම් ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට එම වැන්දඹුවට හිමිකම් තිබුණා වූ ද, ව්‍යවස්ථාදායකයේ යම් මන්ත්‍රීවරයකු වන ඒ මන්ත්‍රීවරයාගේ දරුවකු, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ඒ මන්ත්‍රීවරයාට ගෙවනු ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුපට සමාන විශ්‍රාම වැටුපක්, මේ පනත ආරම්භ වන දිනයේ සිට

ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. ප්‍රධාන පනතේ 7අ වගන්තියේ (5), (6), (7) හා (8) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ උපවගන්තිය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප කට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු ය.